**ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය - 2023**

**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

1.1 තත්ත්වාගණනය කළ මතය

**ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ** 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුලත්ව මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධවපරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේවාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී.වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තරපාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නාලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 2.1.1 අනුව වත්කමක් බැහැර කිරීමේදි එම වත්කම්වලට අදාල ප්‍රත්‍යාගණන සංචිතය ද ගැලපිය යුතු වුවද, මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුළ ඉවත් කරන ලද පරිගණකවලට අදාල රු.119,680 ක් වූ ප්‍රත්‍යාගණන අතිරික්තය ගැලපීමෙන් තොරව ප්‍රත්‍යාගණන සංචිතය දක්වා තිබුණි. | බැහැර කරන ලද වත්කම්වලට අදාල ප්‍රත්‍යාගණන සංචිත නිවැරදි ගිණුම් ප්‍රතිපත්ති අනුව නිවැරදි කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව ප්‍රත්‍යාගණන සංචිත ගැලපීමට කටයුතු කල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමෙන් රු.896,081 ක හර ශේෂයක් පැවතියද, විගණනය ගණනය කිරීම අනුව එම ශේෂය රු.4,186,082 ක බැර ශේෂයක් වීම හේතුවෙන් රු.5,082,163 ක වෙනසක් පැවතුණි. | 2023 වර්ෂයේ රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ලබා නොගැනීම මත රජයේ ප්‍රාග්ධන ගිණුමේ හර ශේෂයක් පෙන්නුම් කරයි. ඉදිරියේදි නිවැරදි කරනු ලැබේ. | ප්‍රාග්ධන ප්‍රදාන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දී මණ්ඩලයේ සංවත්සර උත්සවය සඳහා ශාලා පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් ශ්‍රී ලංක මහා බැංකුව වෙත ගෙවූ | අතපසුවීමකින් නැවත ලැබිය යුතු තැන්පතුව වන රු.25,000 ක මුදල මණ්ඩල අරමුදලට ගලපා ඇත. එය | ජංගම වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ආපසු ගෙවනු ලබන රු.25,000 ක තැම්පතුව, ආපසු ලැබිය යුතු තැම්පතු ලෙස ජංගම වත්කම් යටතේ හඳුනා නොගෙන සමාලෝචිත වර්ෂයේ වියදමක් වශයෙන් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආපසු ලැබිය යුතු තැම්පතු හා ලාභය එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. මෙම මුදල 2024 ජනවාරි මාසයේදි ලැබී ඇත. | |
| (ඇ) | ඩිප්ලෝමා පාඨමාලා සිසුන් මූලික කර ගෙන මණ්ඩලයේ මුදලින් ටී ෂර්ට් 52 ක් සඳහා රු.87,100 ක මුදලක් දරා තිබුණු අතර ඉන් ටී ෂර්ට් 45 ක් සඳහා සිසුන්ගෙන් මුදල් ලැබී තිබූ නමුත්, ඉතිරි ටී ෂර්ට් 07 කට අදාළ රු.11,725 ක් වූ තොග ශේෂය මූල්‍ය ප්‍රකාශන තුල දක්වා නොතිබුණි. | ඉතිරි ටී ෂර්ට් ප්‍රමාණය අදාල සිසුන්ට ඉදිරියේදි ලබාදීමට නියමිත බැවින් අදාල පිරිවැය තොගයක් ලෙස හඳුනාගෙන නොමැත. ඉදිරි ගිණුම්වලදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ඉතිරි තොග නිවැරදිව හඳුනාගත යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1973 අංක 05 දරණ ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතේ 25 වන වගන්තිය. | තාක්ෂණික දියුණුවත් සමග e-පුවත්පත් ප්‍රකාශනය ක්‍රමයෙන් වර්ධනය වී ඇති අතර එම පුවත්පත් ලියාපදිංචිය සම්බන්ධයෙන් පනතේ විධිවිධාන සංශෝධනය කර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | විද්‍යුත් මාධ්‍ය සම්බන්ධව විකාශණ අධිකාරියක් ආරම්භ කිරීමට අනුමැතිය ලැබී ඇත. ඊට සරිලන පරිදි ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත සංශෝධනය කරනු ලැබේ. | පුවත්පත් මණ්ඩල පනතට අදාළව සංශෝධන කාලීනව සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 1973 අංක 05 දරණ ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතේ 26 වන වගන්තිය. | සෑම පුවත්පතකම මුද්‍රණකරු සහ ප්‍රකාශක විසින් මුද්‍රණය කරනු ලබන හෝ පළ කරනු ලබන සෑම තදනන්තර සහ අන්‍යාකාර මුද්‍රණයක හෝ මුද්‍රණාංකයක පිටපතක් කොමසාරිස්වරයාගේ කාර්යාලයට භාරදීමට සැලැස්විය යුතු වුවත් එසේ සිදු නොවීම නිසා 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා පුවත්පත් හා සඟරා ලබා | විවිධ අවස්ථාවල ලිඛිතව හා වාචිකව පුවත්පත් කර්තෘවරුන්ටත් නීති අංශවලටත් දැනුම් දී තිබූ නමුත් මුද්‍රණ පිරිවැය, ප්‍රවාහන පිරිවැය ඉහල යාම නිසා නිසි වේලාවට ලබාදීමේ හැකියාවක් නොමැති බැවින් එක් පිටපතක් මිලදී ගනු ලැබේ. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගැනීමට මණ්ඩලයට රු.532,900 ක අතිරේක වියදමක් දැරීමට සිදු වී තිබුණි. | | |
| (ඈ) 1973 අංක 05 දරණ ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතේ 30 වන වගන්තිය. | ලියාපදිංචි නොකර වෙළඳපලට නිකුත් කරන පුවත්පත් සම්බන්ධව කටයුතු කිරීමට අවශ්‍ය රීති හා නියෝග සම්පාදනයට ක්‍රියා කර නොතිබුණි. | 2021 ජනවාරි 12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අමාත්‍යාංශ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත්කරන ලදී. පනත සංශෝධනයට කටයුතු කරමින් පවතී. | පනත ප්‍රකාරව රීති හා නියෝග සම්පාදනය කළ යුතුය. |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (ඇ)මු.රෙ.104 (1), (3), (4) | 2023 පෙබරවාරි 01 දින අනතුරටපත් **ත්‍රිරෝද රථය සම්බන්ධයෙන් පරීක්ෂණ මණ්ඩලයක් පත් කිරීමට මාස 03 කට අධික කාලයක් ගතවී තිබූ අතර අලාභහානි සම්බන්ධයෙන්** ප්‍රාරම්භක වාර්තාවක් ලබාදීමට කටයුතු කර නොතිබුණි. හානි සම්බන්ධයෙන් වූ පොදු 28 ආකෘති පත්‍රය අනුව පූර්ණ වාර්තාවක් 2024 ජූනි 19 දින දක්වා ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් වලදී නියමිත කාල සීමාවක් තුල ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | අලාභ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) මු.රෙ.751 හා 754 | මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුළ බඩු ලේඛන පොත්වල ආරම්භක ශේෂ පමණක් දක්වා තිබූ අතර වර්ෂයේ ලැබීම්, නිකුත්කිරීම් හා සමාලෝචිත වර්ෂය අවසන් දිනට ශේෂයන් දක්වා නොතිබුණි. තොග සැසඳුම් වාර්තාවකින් තොරව භෞතිකව ලබා ගත් තොග | සීමිත කාර්යය මණ්ඩලයකින් කටයුතු පවත්වාගෙන යන බැවින් බඩු ලේඛන යාවත්කාලීන කිරීමේදි ගැටළු ඇතිවී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ලේඛන යාවත්කාලීන කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ශේෂය මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | | |
| (ඊ) | මු.රෙ.756 (6) | සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වන දින හෝ එකී දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත් කළ යුතු වුවත් 2023 වර්ෂයට අදාළව පත් කළ යුතු භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය 2024 ජනවාරි 10 වන දින විටත් පත් කර නොතිබුණු අතර 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2024 ජුනි මස 19 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි . | නිලධාරීන් 10 ක ගේ පමණ හිඟයක් පවතින බැවින් කමිටුව පත් කිරීම ප්‍රමාද විය. | භාණ්ඩ සමීක්ෂණ වාර්තා මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.363,321 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,653,226 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. රු.1,289,905 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රජයේ ප්‍රදානය රු.960,000 කින් අඩුවීම, උපයෝගී වියදම් රු.1,328,688 කින් හා වෙනත් මෙහෙයුම් වියදම් රු.669,957 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ)මණ්ඩලය විසින් 2023 වර්ෂයේදී ජනමාධ්‍යවේදීන්ගේ දරුවන් සඳහා නොමිලේ ලබාදීමට රු.316,837 ක පාසල් උපකරණ කට්ටල මිලදී ගෙන තිබූ අතර 2021 වර්ෂයේදී මිලදී ගත් වටිනාකම රු.72,330 ක් වූ පාසල් උපකරණ කට්ටල 13 ක් හා 2023 වර්ෂයේ මිලදී ගත් වටිනාකම රු.7,455 ක් වූ පාසල් උපකරණ කට්ටල 02 ක් විගණිත දින වූ 2024 මැයි 17 දින වන විටත් ගබඩාවේ තිබුණි. | 2021 ඉතිරි උපකරණ කට්ටල 13 ක් හා 2022 ඉතිරි කට්ටල 02 සමග කට්ටල 15 ක් මාධ්‍යවේදීන් නොපැමිණීම මත ඉතිරිවී ඇත. | අදාළ පාසල් උපකරණ බෙදා හැරීමට කටයුතු කළ යුතුය. |
| (ආ)සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රවෘත්ති පත්‍රවලට විරුද්ධව මහජනතාව සහ විවිධ ආයතනවලින් ලද පැමිණිලි 48 ක් සහ 2022 වර්ෂයේ නොවිසඳී ඉදිරියට ගෙනා පැමිණිලි 23ක් ද | විවිධ හේතු මත පරික්ෂණ කටයුතු පවත්වා ගෙන යාමේදී ප්‍රමාදයන් ඇතිවීමට හා විවිධ හේතු මත ක්‍රියාත්මක නොවීම් මෙන්ම පාලනය කල නොහැකි හේතුන් | පරික්ෂණ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| ඇතුළුව මුළු පැමිණිලි සංඛ්‍යාව 71 ක් වූ අතර ඉන් පැමිණිලි 16 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විමර්ශනය වෙමින් පැවතුණි. | නිසා පරික්ෂණ ප්‍රමාදවීමේ හැකියාවක් ඇත. | |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයේ ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් භාවිතයට ගත හැකි වටිනාකම රු.365,668 ක් වූ ඇසුරුම ඉවත් නොකල නව ලැප්ටොප් පරිඝණකයක් 2021 දෙසැම්බර් මස සිට ඌන උපයෝජිතව පැවතුණි. | ලැප්ටොප් පරිගණකය සජීවී වැඩ සටහන් සඳහා ලබාගෙන ඇත. නිශ්කාර්යව නොපවත්වා භාවිතයට ගැනීමට උපදෙස් දෙන ලදී. | මිලදී ගනු ලැබූ පරිගණක වැඩ සටහන් අවශ්‍යතාවය සඳහා උපයෝජනය කර ගත යුතුය. |

**3.3 වාහන පද්ධතිය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය සතු අනතුරට පත් ත්‍රිරෝද රථය අලුත්වැඩියා කිරීම සඳහා විගණිත දින වන විට රු.237,552 ක් පමණක් රක්ෂණ සමාගමෙන් ආවරණය කර තිබුණු අතර, රු.339,102 ක් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කිරීමකින් තොරව මණ්ඩලය විසින් රු.576,654 ක් 2024 ජුලි 23 දින වන විට ගෙවා තිබුණි. | අනතුරින් පසුව මෙම රථය අළුත්වැඩියාව සඳහා ශ්‍රී ලංකා නියෝජිත සමාගම වෙත භාරදී ඇත. රක්ෂණ සමාගම සමග ගැටළුවක් මත ප්‍රමාද විය. නිවැරදිව ඇස්තමේන්තු සකස්කර ගෙවීම්කර ඇත. | මණ්ඩලයට සිදු වූ අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය හා 2021 නොවැම්බර් 16 දිනැති 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දී ඇති රාජ්‍ය ව්‍යාපාර සඳහා වන මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශ විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කල යුතු වුවද මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබූයේ 2024 මැයි 15 දින දීය. | ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල ගොඩනැගිල්ල නව ගොඩනැගිල්ලකට ස්ථාපනය කිරීමට සිදුවීම නිසා 2023 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීමට ප්‍රමාද විය. | ජාතික විගණන පනත හා චක්‍රලේඛය ප්‍රකාරව නියමිත කාල සීමාවේදී ගිණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |